# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
## கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
## DEPARTMENT OF COOPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephon: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02
த.பெ.இ.419, இல. 330, யூனியன் ப்ளேஸ், கொழும்பு 02
P.O.Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපැල / மின்அஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல / My No: ස.සං.දෙ./බැංකු/2/4/9

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2021.02. 03

**නියාමන උපදෙස් - බැ/නි/ඒ/2021/06**

සියලුම පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන් වෙත,

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාලීනව නිකුත් කරනු ලබන මූල්‍ය ප්‍රතිපත්ති තීරණ පිළිබඳව පොදු ජනතාව වෙත කෙරෙන සන්නිවේදනයන් කෙරෙහි සමුපකාර අංශයේ අවධානය යොමු කරවීම**

1. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මෙම ප්‍රකාශය තුළින් සමකාලීන ආර්ථික ක්‍රියාකාරකම් සහ මූල්‍ය වෙළෙඳපල තත්ත්වයන්, තොරතුරු සහ ඉදිරි කටයුතු පිළිබඳව අදාල පාර්ශවන්ට තීරණයන් ගැනීමට සහ විවිධ පියවරයන් සඳහා ප්‍රයෝජනවත් වේ.

2. මෙම සන්නිවේදනයෙහි අන්තර්ගත කරුණු සමුපකාර මූල්‍ය සේවා පද්ධතියට සහ විශේෂයෙන් සමුපකාර ග්‍රාමීය බැංකු අංශයේ විවිධ ප්‍රතිපත්ති තීරණයන්ට එළඹෙන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ට සහ බැංකු සේවා ප්‍රධානීන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

   තවද, අප දෙපාර්තමේන්තුවේ සංවර්ධන සහ විගණන නිලධාරීන්ට සමුපකාර මූල්‍ය සේවා සමිතිවල බැංකු කටයුතු, වත්කම් සහ වගකීම් කළමනාකරණය, ආයෝජන තීරණයන් සමාලෝචනය කිරීමේ දී උපයෝගී කර ගත හැකි විය.

3. මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශනය උපයෝගී කර ගත හැකි ක්ෂේත්‍රයන්
   i. තැන්පත් නිපයුම් සහ පොළී අනුපාත තීරණය කිරීමට.
   ii. උකස් ණය ඇතුළු විවිධ ණය, අත්තිකාරම් සහ පොළී අනුපාත තීරණය කිරීමට.
   iii. විදේශීය ව්‍යවහාර මුදල් (Foreign Currency) අනුපාතයන් භාවිතා කරමින් විදේශීය ප්‍රේෂණ ගිණුම්ගත කිරීම සඳහා.
   iv. භාණ්ඩ හා සේවාවල අනාගත මිල ගණන් තිරණය කිරීමට.
   v. ශ්‍රී ලංකාවේ පවතින උද්ධමන අනුපාතය, විරැකියා අනුපාතය, විදේශීය සංචිත ප්‍රමාණය පිළිබඳව දැනුවත් කිරීම සඳහා.
   vi. වෙනත් ආර්ථික, සාමාජීය සහ පාරිසරික වැදගත්කමක් දක්වන විවිධ මූල්‍ය පහසුකම් සඳහා බැංකු විසින් ඉදිරිපත් කළ යුතු කොන්දේසි සහ නියමයන් තීරණය කිරීමට.

4. භාවිතා කරන පාර්ශවයන්ගේ පහසුව සඳහා 2021 වසර තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශයට පත් කිරීමට යෝජිත දිනයන් මෙසේය.

| නිවේදන අංකය | නිවේදන දිනය |
|---|---|
| 1 | ජනවාරි 19 ( අඟහරුවාදා) |
| 2 | මාර්තු 04 (බ්‍රහස්තින්දා) |
| 3 | අප්‍රේල් 08 (බ්‍රහස්තින්දා) |
| 4 | මැයි 20 (බ්‍රහස්තින්දා) |
| 5 | ජූලි 08 (බ්‍රහස්තින්දා) |
| 6 | අගෝස්තු 19 (බ්‍රහස්තින්දා) |
| 7 | ඔක්තෝබර් 14 (බ්‍රහස්තින්දා) |
| 8 | නොවැම්බර් 20 (බ්‍රහස්තින්දා) |

මෙය ශ්‍රී ලංකා මහ බැංකුවේ www.cbsl.gov.lk යන වෙබ් අඩවියෙන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසී යන මාධ්‍යන්ගෙන් ලබා ගත හැක.

මෙම උපදෙස් සහ මගපෙන්වීම් පිළිබඳව ඔබ පළාතේ මූල්‍ය සේවා සමුපකාර සමිති සහ ඔබගේ දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරීන් සහ විගණන නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

සුවින්ද එස්. සිංගප්පුලි,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්